රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**<u>ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ අධ්‍යක්ෂ, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, ප්‍රධාන කෘෂි විද්‍යාඥ හා අතිරේක අධ්‍යක්ෂ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම</u>**

අංක 1971/17 හා 2016.06.15, අංක 2032/33 හා 2017.08.17, අංක 2165/14 හා 2020.03.03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයන්ගෙන් සංශෝධිත අංක 1880/26 හා 2014.09.19 දිනැති ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11.2 උප ඡේදයේ විධිවිධාන අනුව, පුරප්පාඩුව ඇති ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ අධ්‍යක්ෂ, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, ප්‍රධාන කෘෂි විද්‍යාඥ හා අතිරේක අධ්‍යක්ෂ තනතුරු සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තෝරාගැනීමේ ක්‍රමය

2.1 ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා , ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අනුමත ලකුණු පරිපාටියක් අනුව සියළු අයදුම්කරුවන් වෙත ලකුණු පිරිනමා ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

2.2 අංක 1880/26 හා 2014.09.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද හා අංක 1971/17 හා 2016.06.15, අංක 2165/14 හා 2020.03.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයන්ගෙන් සංශෝධිත ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව අධ්‍යක්ෂ, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, ප්‍රධාන කෘෂි විද්‍යාඥ හා අතිරේක අධ්‍යක්ෂ තනතුරු සඳහා අයදුම් කිරීමේ අවම සුදුසුකම් පහත සඳහන් කර ඇත.

**<u>අධ්‍යක්ෂ, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ හා අතිරේක අධ්‍යක්ෂ තනතුරු :-</u>**

- ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ (I පන්තියේ) නිලධාරියෙකු වීම
- ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පළමු උපලේඛණයට අනුව අයදුම්කරනු ලබන තනතුරට අදාල ධාරාවේ නිලධාරියෙකු වීම

**<u>ප්‍රධාන කෘෂි විද්‍යාඥ තනතුර :-</u>**

- ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ (I පන්තියේ) නිලධාරියෙකු වීම
- කෘෂි පර්යේෂණ ධාරාවට අයත් නිලධාරියෙකු වීම

03. අයදුම්පත් කැඳවනු ලබන තනතුර, තනතුර අයත් ධාරාව හා පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත සඳහන් කර ඇත.

| අංකය | තනතුරු කාණ්ඩය | තනතුරු කාණ්ඩයට අයත් මුළු පුරප්පාඩු සංඛ්‍යාව | අනු අංකය | පුරප්පාඩුව පවතින තනතුර (තනතුරු නාමය) | පුරප්පාඩුව පවතින තනතුර අයත් ධාරාව |
|---|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ (වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු) | 2 | 1.1 | අධ්‍යක්ෂ (වාරිමාර්ග අමාත්‍යාංශය) | කෘෂි සංවර්ධන හෝ කෘෂි පර්යේෂණ හෝ කෘෂි ආර්ථික විද්‍යා |
| | | | 1.2 | අධ්‍යක්ෂ (බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව) | |
| 2 | අධ්‍යක්ෂ (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව) | 2 | 2.1 | අධ්‍යක්ෂ(සමාජ ආර්ථික හා සැලසුම්) | කෘෂි ආර්ථික විද්‍යා |
| | | | 2.2 | අධ්‍යක්ෂ(ස්වාභාවික සම්පත් කළමනාකරණ) | කෘෂි සංවර්ධන හෝ කෘෂි පර්යේෂණ |
| 3 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | 2 | 3.1 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (මහනුවර) | කෘෂි සංවර්ධන හෝ කෘෂි පර්යේෂණ හෝ කෘෂි ආර්ථික විද්‍යා |
| | | | 3.2 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (මඩකලපුව) | |
| 4 | ප්‍රධාන කෘෂි විද්‍යාඥ | 8 | 4.1 | ප්‍රධාන කෘෂි විද්‍යාඥ (ශාක අභිජනනය - එළවළු, මල් හා අල භෝග) | කෘෂි පර්යේෂණ |
| | | | 4.2 | ප්‍රධාන කෘෂි විද්‍යාඥ (ශාක ව්‍යාධි විද්‍යා - පලතුරු භෝග) | |
| | | | 4.3 | ප්‍රධාන කෘෂි විද්‍යාඥ (ශාක ව්‍යාධි විද්‍යා - ක්ෂේත්‍ර භෝග) | |
| | | | 4.4 | ප්‍රධාන කෘෂි විද්‍යාඥ (ශාක ව්‍යාධි විද්‍යා-වී) | |
| | | | 4.5 | ප්‍රධාන කෘෂි විද්‍යාඥ (ශාක ව්‍යාධි විද්‍යා - මාෂ හා තෙල් භෝග) | |
| | | | 4.6 | ප්‍රධාන කෘෂි විද්‍යාඥ (කීට විද්‍යා - මාෂ හා තෙල් භෝග) | |
| | | | 4.7 | ප්‍රධාන කෘෂි විද්‍යාඥ (ජෛව මිතිය) | |
| | | | 4.8 | ප්‍රධාන කෘෂි විද්‍යාඥ (කෘෂි දේශගුණ විද්‍යාව) | |
| 5 | අතිරේක අධ්‍යක්ෂ | 4 | 5.1 | අතිරේක අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන- මූලස්ථාන) | කෘෂි සංවර්ධන |
| | | | 5.2 | අතිරේක අධ්‍යක්ෂ (කෘෂි ප්‍රකාශණ) | |
| | | | 5.3 | අතිරේක අධ්‍යක්ෂ (පැලෑටි ජාන සම්පත්) | කෘෂි පර්යේෂණ |
| | | | 5.4 | අතිරේක අධ්‍යක්ෂ (පැලෑටි සංරක්ෂණ) | කෘෂි සංවර්ධන හෝ කෘෂි පර්යේෂණ |

04. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියට අයත් තනතුරු සඳහා තෝරා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති තෝරා ගැනීමේ පරිපාටි වල පිටපත් මේ සමඟ අමුණා එවා ඇති අතර, එම ලකුණු පරිපාටිය පිළිබඳ විස්තර එම පරිපාටි වල සඳහන් කර ඇත.

05. නිලධාරියෙකුගේ මනාපය පරිදි ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු වලට අයදුම් කිරීමේ අවස්ථාව හිමි වන අතර, මෙසේ අයදුම් කරන තනතුරු පිළිබඳ මනාපය , අනුපිළිවෙලින් අයදුම්පතේ අදාල ස්ථානයේ සටහන් කල යුතු වේ. එහි දී තමන්ගේ අභිමතය පරිදි ප්‍රමුඛතා අනුපිළිවෙල තෝරා ගත යුතු අතර, ඉහළ මනාපයක් පළ කර ඇති තනතුරක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඉන් පසු මනාපය පළ කර ඇති තනතුරක් සඳහා කිසිසේත්ම සලකා නොබලන බව අවධාරණය කරමි. තව ද තෝරාගනු ලබන තනතුර සඳහා පත්වීම් සිදු කරනු ලබන්නේ එම තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණය පවත්වන ලද දින සිට ක්‍රියාත්මක වන පරිදි බව ද සඳහන් කරමි.

06. අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර එවිය යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මේ සමඟ අමුණා එවා ඇති අතර, මෙම අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය...2022.07.29.... වේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අදාල ඒකක ප්‍රධානියාගේ හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිතව අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට හෝ ඊට පෙර "ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, 80/5, "ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුවේ. මේ සම්බන්ධයෙන් ඔබ ආයතනය/ මධ්‍යස්ථානය/ඒකකය යටතේ සේවයේ නියුතු ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ සියළුම නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය
2022.07..06..

එම්.බී. රෝහණ පුෂ්පකුමාර
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක. 80/5. "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.